මගේ අංකය :- SG/Admin/CS /8/මැතිවරණ,
ආයතන අංශය,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

2020.07. 30 දින.

සියලුම අතිරේක සර්වේයර් ජනරාල්වරුන්,
සියලුම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්,
අධ්‍යක්ෂ (මැ.සි.ආ.) / සියලුම පළාත් සර්වේයර් ජනරාල්වරුන්,
අධ්‍යක්ෂ (මුදල්), ප්‍රධාන අභ්‍යන්තර විගණක,
සියලුම නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්,
සියලුම ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීවරුන් / මිනින්දෝරු අධිකාරීවරුන්,
සහකාර අධ්‍යක්ෂ (පාලන),
ප්‍රධාන කාර්මික හා පරිපාලන නිලධාරී, කාර්මික හා පරිපාලන නිලධාරීන්,
පරිපාලන නිලධාරී (වැ.බ.),

**පාර්ලිමේන්තු මැතිවරණය - 2020.08.05**
**ඡන්ද විමසීම් කාල සීමාව තුළ රාජ්‍ය ආයතන වල උත්සව හා පුහුණු වැඩසටහන් සඳහා මැතිවරණයට තරඟ කරන අපේක්ෂකයන් කැඳවා පක්ෂ / අපේක්ෂක ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම වැළැක්වීමේ අවශ්‍යතාව**

උක්ත කරුණ සම්බන්ධව ජනාධිපති ලේකම්ගේ අංක : පීඑස්/සීඑස්ඒ/00/1/2/9 හා 2020.07.16 දිනැති පීඑස්/සීඑස්ඒ/චක්‍රලේඛ/25/2020 දරණ චක්‍රලේඛය හා බැඳේ. (අදාළ චක්‍රලේඛයෙහි පිටපතක් මේ සමඟ අමුණා ඇත)

02. එම චක්‍රලේඛයෙහි සඳහන් කරුණු පිළිබඳව විශේෂ අවධානය යොමු කරන ලෙසටත් ඔබ යටතේ සිටින නිලධාරීන් එම කරුණු පිළිබඳව දැනුවත් කර ඒ අනුව කටයුතු කරන ලෙසටත් කාරුණිකව දන්වා සිටිමි.

එච්.එම්.ටී.පී. හේරත්
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පාලන)
සර්වේයර් ජනරාල් කාර්යාලය
තැ.පෙ. 506, කිරුල පාර,
කොළඹ 05.

එච්.එම්.ටී.පී.හේරත්,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (පාලන)
සර්වේයර් ජනරාල් වෙනුවට.

ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

මගේ අංකය : පීඑස්/සීඑස්ජ්/00/1/2/9 චක්‍රලේඛ අංකය : පීඑස්/සීඑස්ජ්/චක්‍රලේඛ/25/2020

2020 ජූලි මස 16 වන දින

සියලුම ගරු ආණ්ඩුකාරවරුන්
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
සියලුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සියළුම පළාත් පාලන ආයතන ප්‍රධානීන්
සියළුම රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල ප්‍රධානීන්

**පාර්ලිමේන්තු මැතිවරණය - 2020.08.05**
**ඡන්ද විමසීම් කාල සීමාව තුළ රාජ්‍ය ආයතනවල උත්සව හා පුහුණු වැඩසටහන් සඳහා මැතිවරණයට තරඟ කරන අපේක්ෂකයන් කැඳවා පක්ෂ / අපේක්ෂක ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම වැළැක්වීමේ අවශ්‍යතාව**

2020 අගෝස්තු මස 05 වන දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයේ දී අපේක්ෂකයෙකු ලෙස තරඟ කරන්නේ නම් අදාළ විෂයය භාර අමාත්‍යවරයා වුව ද සහභාගි කරවා ගත යුත්තේ නිල රාජකාරිමය කටයුතු සඳහා අත්‍යවශ්‍ය නම් පමණක් බව මැතිවරණ කොමිෂන් සභාව විසින් දන්වා තිබියදී, රාජ්‍ය ආයතන සමහරක් විවිධ උත්සව හා පුහුණු වැඩසටහන් සඳහා එකී විෂයයට කිසිදු සම්බන්ධතාවයක් නොමැති මෙම ඡන්ද විමසීමේ දී තරඟ කරනු ලබන අපේක්ෂකයන් (සමහර අවස්ථාවලදී අපේක්ෂකයන් ගේ කලත්‍රයන්) සහභාගි කරවා ගෙන පක්ෂ / අපේක්ෂක ප්‍රවර්ධන කටයුතු සිදු කරන බව පැමිණිලි ලැබී ඇති බවට මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති විසින් අංක : EC/EDR/PE/2020/01(පොදු) හා 2020.07.04 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා තිබේ.

නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා අවශ්‍ය සියලුම පියවර ගත යුතු බව අතිගරු ජනාධිපතිතුමන් මීට ප්‍රථම ද වරින්වර ඔබ වෙත අවධාරණය කර ඇත.

එබැවින්, මෙම ඡන්ද විමසීම් කාල සීමාව තුළ සියළුම ආකාරයේ රාජ්‍ය ආයතනවල උත්සව හා පුහුණු වැඩසටහන් යනාදිය සඳහා මෙම මැතිවරණයට තරඟ කරන අපේක්ෂකයින් සහභාගි කරවා ගැනීමෙන් සහ පක්ෂ අපේක්ෂකයින් ප්‍රවර්ධන කටයුතු සිදුවන සේ ක්‍රියා කිරීමෙන් වැළකිය යුතු බවට අවධාරණය කරමි.

තවද, අත්‍යවශ්‍යම නිල රාජකාරි කටයුත්තක් සඳහා විෂයය භාර අමාත්‍යවරයා මෙවැනි අවස්ථා වලට සහභාගි කරවා ගැනීම අවශ්‍ය නම්, ඒ බව මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති විධානවලට අනුකූලව, මැතිවරණ කොමිෂන් සභාව වෙත පූර්වයෙන් දැනුම් දීමට කටයුතු කරන ලෙස ද වැඩිදුරටත් දන්වා සිටිමි.

පී.බී. ජයසුන්දර
ජනාධිපති ලේකම්

පිටපත් :
1. අග්‍රාමාත්‍ය ලේකම්
2. අමාත්‍ය මණ්ඩල ලේකම්
3. විගණකාධිපති
4. සභාපති, මැතිවරණ කොමිෂන් සභාව

ගාලු මුවදොර, කොළඹ 01 / காலி முகத்திடல், கொழும்பு 01 / Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax ++ 94 11 2446657
ඊ-තැපැල / மின்-அஞ்சல் / e-mail prsec@presidentsoffice.lk

## මැතිවරණ කොමිෂන් සභාව
## தேர்தல்கள் ஆணைக்குழு


පොදු කාර්යාලය : 011-2868441, 2868442, 286844
பொதுஅலுவலகம்
ෆැක්ස්/தொலைநகல்: 011-2868426
web : www.slelections.gov.lk e-mail : info@slelections.gov.lk

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත, රාජගිරිය(10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய(10107)


මගේ අංකය :EC/EDR/PE/2020/01(පොදු)
எனது இல.

ඔබේ අංකය :
CCA/HRA/ST/IO/2020
உமது இல.

දිනය : 2020.07.04
திகதி

08 JUL 2020

ආචාර්ය පී.බී.ජයසුන්දර මහතා
ජනාධිපති ලේකම්

### පාර්ලිමේන්තු මැතිවරණය - 2020.08.05
### ඡන්ද විමසීම් කාල සීමාව තුළ රාජ්‍ය ආයතනවල උත්සව හා පුහුණු වැඩසටහන් සඳහා මැතිවරණයට තරඟ කරන අපේක්ෂකයන් කැඳවා පක්ෂ/අපේක්ෂක ප්‍රවර්ධන කටයුතු සිදුකිරීම වැළැක්වීමේ අවශ්‍යතාව

මෙම ඡන්ද විමසීමේ කාලසීමාව තුළ රාජ්‍ය ආයතන එනම් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා, පළාත් පාලන ආයතන සහ රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල වැනි ආයතනවල වැඩසටහන් හා උත්සව සඳහා අපේක්ෂකයෙකු ලෙස තරඟ කරන්නේ නම් අදාළ විෂය භාර අමාත්‍යවරයා වුවද සහභාගි කරවාගත යුත්තේ නිල රාජකාරිමය කටයුතු සඳහා අත්‍යවශ්‍යම නම් පමණක් බව මැතිවරණ කොමිෂන් සභාව විසින් දන්වා තිබේ.

02. එසේ වුවද රාජ්‍ය ආයතන සමහරක් විවිධ උත්සව හා පුහුණු වැඩසටහන් සඳහා පවා එකී විෂයට කිසිදු සම්බන්ධතාවක් නැති මෙම ඡන්ද විමසීමේ දී තරඟ කරන අපේක්ෂකයන් (සමහර අවස්ථාවලදී අපේක්ෂකයන්ගේ කලත්‍රයන්) සහභාගි කරවා ගෙන පක්ෂ අපේක්ෂක ප්‍රවර්ධන කටයුතු සිදුකරන බවට පැමිණිලි ලැබේ. මෙවැනි එක් පැමිණිල්ලකට අදාළ තොරතුරු ඔබගේ දැනගැනීම සඳහා මෙ සමඟ එවමි.

03. එම පැමිණිලිවල සත්‍ය අසත්‍යතාව කෙසේ වුවද රාජ්‍ය උත්සව හා වැඩසටහන් සඳහා තරඟ කරන අපේක්ෂකයන් (හෝ ඔවුන්ගේ කලත්‍රයන්) සහභාගි කරවා ගෙන දේශපාලනමය ප්‍රවර්ධන කාර්යයන් සිදුකිරීමට අවකාශ දීම නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම පැවැත්වීමට විශේෂයෙන්ම සම භූමියේ තරඟයක් පැවැත්වීමට බාධාවක් බව අමුතුවෙන් සඳහන් කළ යුතු නැත.

04. එබැවින් මේ ඡන්ද විමසීම් කාල සීමාව තුළ සියලුම ආකාරයේ රාජ්‍ය ආයතනවල උත්සව, පුහුණු වැඩසටහන් යනාදිය සඳහා තරඟ කරන අපේක්ෂකයන් සහභාගි කරවා පක්ෂ අපේක්ෂකයින් ප්‍රවර්ධන කටයුතු සිදුවන සේ ක්‍රියා කිරීමෙන් වැළකිය යුතු බවට සියලුම ගරු ආණ්ඩුකාරවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන්, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් වෙත උපදෙස් නිකුත් කරන ලෙස කාරුණිකව ඉල්ලමි.

05. අත්‍යවශ්‍යම නිල රාජකාරී කටයුත්තක් සඳහා විෂයය භාර අමාත්‍යවරයා මෙවැනි අවස්ථාවන්වලට සහභාගි කරවා ගැනීම අවශ්‍ය නම් ඒ බව, මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති විධානවලට අනුකූලව කොමිෂන් සභාව වෙත පූර්වයෙන් දැනුම්දීමට අවශ්‍ය බවද පෙර සඳහන් ආයතන ප්‍රධානීන්ගේ අවධානය යොමු කරවීමට කාරුණික වනු මැනවි.

මහින්ද දේශප්‍රිය
සභාපති
මැතිවරණ කොමිෂන් සභාව